

2520
1976

# වෙසක් සිරිය

# බෞද්ධ ගෘහනිර්මාණය හා ලාංකික සම්ප්‍රදාය

ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයයේ
විද්‍යාලංකාර මණ්ඩපයේ පුරාවිද්‍යා අංශයේ
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
ආචාර්ය
සේනක බණ්ඩාරනායක
විසිනි

අප මෙතෙක් පිළිගෙන සිටියේ ශ්‍රී ලංකාවේ බෞද්ධ ගෘහ නිර්මාණ ශිල්පය මූලික වශයෙන් ම 'දඹදිවින්'! බිළී ආවකැ යි කියා ය. ඉන්දියාවේ සිට සංක්‍රමණය වූ අදහස් උදහස් මාලාව මේ දේශය තුළ දී විශේෂාකාරයෙකින් සංවර්ධනය වූ බව ද ශ්‍රී ලංකාවේ විද්වත්හු ඒ අතරම පිළිගනිති. මෙහි නියම තත්ත්වය එයට වඩා වෙනස්වූත් ඊට වඩා සංකීර්ණවූත් එකක යි අපගේ ගෘහ නිර්මාණ ශිල්පය පිළිබඳ මෑතක සිදු වූ හැදෑරීම් හා පර්යේෂණ වලින් හෙළි වේ. අපි මේ පර්යේෂණයන්හි ප්‍රතිඵල සැකෙවින් දක්වමු නම්, අපට පෙනෙන්නේ ශ්‍රී ලංකාවේ ගෘහ නිර්මාණ ශිල්පයේ විකාශනයෙහි අංශ තුනක් තිබෙන බව යි. ඒ මෙසේ ය.

(1) බෞද්ධ ගෘහ නිර්මාණ ශිල්පයෙන් පෘථුල කොටසක් මේ දේශයේ ම සංවර්ධනය වූයේ මේ රටේ මුල් බැසගත් දේශජ සම්ප්‍රදායයන් ගෙනි.

(2) ඉන්දීය සම්ප්‍රදායයෙන් ඇඳා ගන්නා ලද්දේ හුදෙක් ප්‍රසිද්ධ ගෘහ නිර්මාණ ශිල්පීය අංගෝපාංග කිහිපයක් සහ මල් ලියකම් රටාත් අතලොස්සක් පමණි.

(3) හුදෙක් දේශජ සම්ප්‍රදායය දියුණු කොට ගැනීමේ දී හා ශිල්පීය ක්‍රම මෙහිම තනා ගැනීමේ දී හෝ වේවා එසේ නැත් නම් අදහස් — උදහස් සහ මෝස්තර විදේශයන් ගෙන් ලබා ගැනීමේ දී හෝ වේවා යන දෙකරුණෙහි දී ම ඉතා ම වැදගත් ඓතිහාසික හේතුව වූයේ ශ්‍රී ලංකාව තුළ ම සටගත් අභ්‍යන්තර ප්‍රගති වේගය යි.

මෙ ලිපියේ 'දඹදිව' යන පදයෙන් අප අදහස් කරන්නේ හුදෙක් වර්තමාන ඉන්දීය ජනරජය පමණක් නොව මුළුමහත් දක්ෂිණ ආසියානු අර්ධ මහාද්වීපයත් එහි සංස්කෘතික රටවත් ය. පාකිස්තානය, නේපාලය, කාශ්මීරය, භූතානය, සිකිම් සහ බංග්ලාදේශ වැනි සෙසු නවීන දේශපාලන ඒකකද මෙයට අයත් වේ.